## ලොව වටා පුවත් වියමන

ජනවාරි

### දිනපොත

01. බ්‍රසීලයේ ජනාධිපති ධුරයට ප්‍රථම වරට පත් කාන්තාව 'ඩිල්මා රූසෆ්' බ්‍රසිලියා නුවරදී දිවුරුම් දෙයි.

04. සිය ආරක්ෂක භටයෙකු විසින් තබන ලද වෙඩි ප්‍රහාරයකින් පකිස්ථානයේ පන්ජාබ් ප්‍රාන්තයේ ආණ්ඩුකාර සල්මාන් තාසීර් ජීවිතක්ෂයට පත්වෙයි.

05. ජනාධිපති බැරැක් ඔබාමාගේ පාලනය අර්බුදයකට ලක්කරමින් ඇමරිකා පාර්ලිමේන්තුවේ (කොන්ග්‍රස් මණ්ඩලයේ) බලය විරුද්ධ පක්ෂය වන රිපබ්ලිකන් පක්ෂයට හිමිවේ.

08. ඇමරිකා පාර්ලිමේන්තුවේ වැඩි බලය හිමි කරගත් රිපබ්ලිකන් පක්ෂයේ මන්ත්‍රීවරියක වන ගැබ්රියල් ගිෆෝර්ඩ්ට ඇරිසෝනා ප්‍රාන්තයේ අවන්හලකදී නාඳුනන තුවක්කුකරුවෙක් වෙඩි තබයි.

09. සුඩානය උතුරු සහ දකුණු සුඩාන ලෙස වෙන්විය යුතුද යන්න විමසා බැලෙන ජනමත විචාරණය ඇරඹෙයි.

12. මහ වැසි හේතුවෙන් ඇතිවූ නාය යාම්වලින් බ්‍රසීලයේ කඳුකර නගර තුනක් පස් කඳුවලින් වැසීයාමෙන් පුද්ගලයන් 257 දෙනෙකු පණපිටින් වැළලෙයි.

13. අගමැති සාද් අල් හරිරිගේ නායකත්වයෙන් යුතුව මාස 18ක් ක්‍රියාත්මක වූ ලෙබනන් ආණ්ඩුව බිඳ වැටෙයි. ඊට හේතු වූයේ අගමැතිවරයා විසින් සිය පියා ඝාතනය සම්බන්ධයෙන් ආණ්ඩුවේ සන්ධාන පාර්ශවයක් වන හිස්බුල්ලා සංවිධානයට චෝදනා කිරීමටත්, එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික අපරාධ අධිකරණය හමුවේ නඩු පැවරීමට තීරණය කිරීමටත් විරෝධය දක්වමින් හිස්බුල්ලා සංවිධානයේ මන්ත්‍රීවරුන් ආණ්ඩුවෙන් ඉවත්වීමයි.

14. ටියුනීසියාවේ ජනාධිපති ධුරයේ වසර 23ක් තිස්සේ රැඳී සිටින අල් අබිදිනේ බෙන් අලිට තනතුරෙන් ඉවත් වන ලෙස බල කරමින් දහස් ගණන් රටවැසියන් වීදි බැස උද්ඝෝෂණ කරන්නට පටන් ගැනීමෙන් පසු තනතුරෙන් ඉල්ලා අස්වී රටෙන් පළායයි.

22. වසර දහයක් තිස්සේ රජයට එරෙහි සිවිල් යුද්ධයක නිරතව සිටි නේපාලයේ මාවෝවාදී සංවිධානය සිය විමුක්ති හමුදාව රජයට පවරා දෙයි.

24. රුසියාවේ මොස්කව් නුවර ප්‍රධාන ගුවන් තොටුපොළක් වන ඩොමෝඩෝඩේවෝ මගී පර්යන්තයට කඩා වැදුණු මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් එල්ල කළ ප්‍රහාරයකින් පුද්ගලයන් 35 දෙනෙකු ජීවිතක්ෂයට පත්වී 180 දෙනෙකු තුවාල ලබති.

25. අයර්ලන්ත පාර්ලිමේන්තුව විසුරුවා විසුරුවා හරී. සභාග රජයේ ඇතිවූ අවුල් හේතුවෙන් පාර්ලිමේන්තුව විසුරුවා හළ අගමැති බ්‍රයන් කෝවන් මහ මැතිවරණය මාර්තු 11දා පැවැත්වීමට දින නියම කරයි.

27. වසර 33ක් තිස්සේ ජනාධිපති ධුරයේ රැඳී සිටින අලි අබ්දුල්ලාට ධුරයෙන් ඉවත්වන ලෙස බලකරමින් යේමන වැසියෝ දහස් ගණනින් වීදි බැස උද්ඝෝෂණ අරඹති.

29. ඇෆ්ගනිස්ථානයේ කන්දහාර් පළාතේ නියෝජ්‍ය ආණ්ඩුකාර අබ්දුල් ලතීෆ් අෂ්ණා තලේබාන් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්වේ.

# සුඩානය දෙකඩ වේ




අප්‍රිකාවේ විශාලතම රාජ්‍ය වන සුඩානය රටවල් දෙකක් ලෙස බෙදී යා යුතු බවට රටේ දකුණු දිග වැසියන්ගෙන් 99%ක්ම තීරණය කර ඇති බව එරට ජනමත විචාරණ කොමිසම නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ ජනවාරි අවසන් සතියේදීය. ඒ අනුව මෙතෙක් ලෝක සිතියමේ සුඩානය ලෙස දැක්වූ රාජ්‍ය 2011 වසර මැද සිට උතුරු සුඩානය සහ 'දකුණු සුඩානය', 'නයිල් ජනරජය' හෝ 'කුෂ්' ලෙස දැක්වෙනු ඇති අතර ලෝකයට තවත් රටක් එක්වනු ඇත.

වර්ග කිලෝමීටර් 2 376 001 කින් යුත් සුඩාන රාජ්‍ය උතුරු අප්‍රිකාවේ විශාලතම රාජ්‍යයි. බටහිරින් මධ්‍යම අප්‍රිකානු ජනරජයද උතුරින් ඊජිප්තුව සහ ලිබියාවද නැගෙනහිරින් ඉතියෝපියාව සහ එරිත්‍රියාවද දකුණින් කෙන්යාව උගණ්ඩාව සහ කොන්ගෝවද පිහිටා තිබේ. ලෝකයේ දුප්පත්ම රටවල් දහය අතරින් එකක් වන සුඩානය හමුදා පාලනයක් සහිත රටකි. 1989 සිට එහි පාලකයා ලුතිතන් ජෙනරල් හුසෙන් අහමඩ් අල් බසීර්ය. දශක දෙකක් තිස්සේ පැවති සිවිල් යුද්ධයකින් පසු මෙවර සුඩානයේ ජනමත






විචාරණයක් පැවැත්වූයේ වසර පනහකට පමණ පසුවය.

ඊජිප්තුවේ සහ බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක්ව පැවැති සුඩානයට ස්වයං පාලනයක් ලබාදීම සඳහා යටත් විජිත පාලකයන් 1953 වසරේදී එකගතා ගිවිසුමක් ඇතිකරගත් අතර ඒ අනුව 54 වර්ෂයේ ප්‍රථම වරට සුඩානයේ පාර්ලිමේන්තුවක් ස්ථාපිත කරනු ලැබීය. එමගින් ඇතිකරගන්නා ලද ව්‍යවස්ථාවකට අනුව 1956 ජනවාරි මස 1 දා සිට සුඩානය ස්වාධීන රාජ්‍යයක් ලෙස ලෝකයට

ශ්‍රීලාල් සෙනෙවිරත්න

එක්විය.

ඒ වන විට සුඩානයේ ජන සංයුතිය බහුතර අරාබි ජාතික ඉස්ලාම් භක්තිකයන්ගෙන් සහ ගෝත්‍රික ක්‍රිස්තියානි හෝ ස්වවාදී ආගම් භක්තිකයන්ගෙන් සමන්විත විය. ඉස්ලාම් භක්තිකයන්ගෙන් බහුතරය සුඩානයේ උතුරු ප්‍රදේශයේ ජීවත් වූ අතර දකුණු ප්‍රදේශයේ වැඩි වශයෙන් ජීවත් වූයේ

***<u>2011 ජනවාරි 09 දින සිට 14 දින දක්වා පවත්වනු ලැබූ ඒ ජනමත විචාරණයේදී ඡන්දය පාවිච්චි කිරීමට අයිතිය ලැබී තිබුණේ දකුණු සුඩාන වැසියන්ට පමණි.</u>***

ක්‍රිස්තියානි සහ ස්වවාදී භක්තිකයන්ය. ප්‍රථමයෙන් ආණ්ඩු බලය හිමිකරගත් ඉස්මයිල් අල් අශ්හාරිගේ නායකත්වයෙන් යුත් නැෂනල් යුනියනිෂ්ට් පක්ෂය ඉස්ලාම් බහුතරයෙන් යුක්ත වූ අතර දකුණු දිග ප්‍රදේශය වෙනුවෙන් ෆෙඩරල් පාලන ක්‍රමයක් නිර්මාණය කරන බවට ඔව්හු එහි ජනතාවට පොරොන්දු දුන්හ. එහෙත් ආර්ථික ගැටළු සහ දේශපාලන ව්‍යාකූලතා හේතුවෙන් ආරම්භක වකවානුවේදීම පරිපාලනය නිසි ලෙස පවත්වාගෙන යන්නට පාලක පක්ෂයට නොහැකි විය. එහි ප්‍රතිපලය වූයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ඊබ්‍රාහිම් අබ්බවුඩ් විසින් ලේ වැගිරීමකින් තොරවම ආණ්ඩු බලය සියතට ගැනීමය.

1965 අප්‍රේල් මස පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීම දක්වා ජෙනරාල්වරයා විසින් රට පාලනය කෙළේය. ඔහුගේ පාලන කාලය තුළ දකුණේ ජනතාව වෙනුවෙන් ෆෙඩරල් ක්‍රමයක් ලබාදීම ගැන කිසිදු කතාබහක් සිදු නොවුණි. මැතිවරණයෙන් බලයට පත් අගමැති මහමද් අහමඩ් පාලනයද රටේ ප්‍රශ්ණවලට විසඳුම් දීමට අසමත් දුර්වල පාලනයක් වූ අතර 1968 ඔවුන් විසින් සුඩානය මුස්ලිම් අරාබි රාජ්‍යයක් බවට පත්කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කළේ දකුණු දිග සුඩාන වැසියන්ගේ බලාපොරොත්තු බිඳ දමමිනි. ඉන් ඇතිවන අර්බුධකාරී තත්ත්වය මත 1969 මැයි 25 දින දෙවන වරටත් සුඩාන පාලන බලය හමුදා නායකයෙකු අතට පත්විය. කර්නල් ගෆාර් නිමේරි අගමැතිවරයා බවට පත්වූ අතර ඔහුගේ පාලනයද අර්බුධවලින් පිරුණු එකක් විය.

මෙලෙස සුඩානය මුස්ලිම් නීතියට අනුව පාලනය වන දේශපාලන අර්බුධවලින් ගහණ රටක් බවට පත්වීමෙන් සෙසු ආගමික කණ්ඩායම් දිගින් දිගටම පීඩාවට පත්වීමේ ප්‍රථිපලයක් ලෙස සිය ස්වයං පාලන අයිතිය දිනාගැනීම සඳහා සන්නද්ධ අරගලයකට යාමට දකුණු දිග සුඩාන වැසියන්ට සිදුවිය. එහි අස්වැන්න බෙහෙවින් බියකරු විය. සුඩාන විමුක්ති හමුදාව 1983දී සුඩානයේ දකුණු ප්‍රදේශයට ස්වයං පාලනයක් දිනාගැනීම සඳහා ආරම්භ කළ යුද්ධය දශක දෙකක් තිස්සේ ඉදිරියට ඇදී ගිය අතර ඒ හේතුවෙන් විසි ලක්ෂයක් පමණ ජීවිතක්ෂයට පත්වූහ. රට දුප්පත් කමේ අගාධයේ පතුලටම ඇද වැටුනේය.

සුඩාන හමුදා පාලනය සහ සුඩාන විමුක්ති හමුදාව අතර දිගින් දිගටම සිදුකෙරුණ ලේ වැගිරීම් වලට විරාමයක් ලැබෙන්නේ 2005 වසරේදිය. ඒ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීමෙන් දෙපාර්ශ්වය අතර ඇතිකෙරෙන විස්තීර්ණ සාම ගිවිසුමක ප්‍රතිඵලය ලෙසිනි. ඒ වන විට සුඩානයේ දකුණු ප්‍රදේශය සුඩාන ආණ්ඩුවේ පාලනය නොතකා සුඩාන විමුක්ති හමුදාවේ පාලනයට නතුවූ ප්‍රදේශයක්ව පැවැතියේය. සාම ගිවිසුමට අනුව සිය අනාගතය තීරණය කිරීම සඳහා දකුණු සුඩානයේ වැසියන්ට අවස්ථාව ලබාදෙමින් ජනමත විචාරණයක් පැවැත්වීමට සුඩාන හමුදා පාලනය එකගවී තිබිණ.

2011 ජනවාරි 09 දින සිට 14 දින දක්වා පවත්වනු ලැබූ ඒ ජනමත විචාරණයේදී ඡන්දය පාවිච්චි කිරීමට අයිතිය ලැබී තිබුණේ දකුණු සුඩාන වැසියන්ට පමණි. ඡන්දදායකයන් කොටස් තුනක් යටතේ වර්ග කරනු ලැබ තිබුණි. ඒ දකුණු සුඩානයේම ජීවත්වන දකුණු සුඩාන වැසියන්, දකුණු සුඩානයෙන් පිටස්තරව සුඩානයේ වෙනත් ප්‍රදේශවල ජීවත්වන දකුණු සුඩාන වැසියන් සහ විදෙස්ගත දකුණු සුඩාන වැසියන් ලෙසිනි. මේ කාණ්ඩ තුනෙන් වෙනම රටක් ලෙස වෙන්වයාමට කැමැත්ත ප්‍රකාශ කර ඇති ඡන්දදායක ප්‍රතිශතය පිළිවෙළින් 98.87%ක්, 57.69ක් සහ 98.55%කි. පතිඵලය අනුව දකුණු සුඩානයේ අති බහුතර ජනතාව වෙනම රටක් වෙනුවෙන් කැමැත්ත පළකරනු ලැබ ඇති බැවින් ලබන ජූලි මාසයේ නව රජය ප්‍රකාශයට පත්කෙරෙනු ඇත.

VCE Excellence
Since 1998
Physics and IT Subjects
Private Tutoring for VCE
Year 11 & 12.

Face the challenges of VCE with best learning strategies and achieve A+ results!
(Limited number of places are still available for Y11/12. Please ring us to secure your place.)

**Year 10 – Special Physics and Science Foundation Course-** To better prepare students for the VCE Physics stream.
Affordable small group classes to commence from March 2011 at Gladstone Park/Tullamarine area. You can register your interests now.

Email:vcee.melbourne@gmail.com
or ring Wasantha on 0419320845